කාර්යාලය / அலுவலகம் / Office

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887440

ෆැක්ස් / தொலை நகல் / Fax: 011-2868917

හරින් ප්‍රනාන්දු (පා.ම)

ஹரின் பர்ணாந்து (பா.உ.)

HARIN FERNANDO (M.P)

සංචාරක, ඉඩම් සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය

சுற்றுலாத்துறை, காணி மற்றும் விளையாட்டுத்துறை இளைஞர் விவகார அமைச்சர

MINISTER OF TOURISM, LANDS AND SPORTS & YOUTH AFFAIRS

අමාත්‍යාංශ ලේකම් / அமைச்சின் செயலாளர் / Secretary to the Ministry: 011-2888907


මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2024/07/25

හිතවත් අනුර දිසානායක මහතා වෙත,

**විදෙස් රටකදී ඔබ විසින් කරන ලද අසත්‍ය ප්‍රකාශය සම්බන්ධවයි!**

ඔබ විසින් සිදුකළ විදෙස් සංචාරයක් අතරතුර මා ඉලක්ක කරගනිමින් කළ ප්‍රකාශයක් පිළිබඳව මාගේ අවධානය යොමු වූ අතර එකී අවඥා සහගත සහ පදනම් විරහිත ලෙස නැගූ චෝදනාව පිළිබඳව මා විමතියට පත්වීමි.

විදෙස් සංචාර සඳහා මා විසින් රජයේ මුදල් භාවිතා කළ බවට හැඟවෙන ලෙස ඔබ විසින් කරන ලද ප්‍රකාශ, ඒ ප්‍රකාශ වලටම උරුම පිළිකුලෙන් යුතුව හෙළා දකිමි.

හාස්‍යජනක කරුණ වන්නේ ඔබ විසින් එකී චෝදනාව සිදුකරන්නේද ඔබ විදෙස්ගතව සිටියදී ම වීම ය.

අපේ රට බරපතල බෙදවාචකයකට වැටී රටම හුස්ම අදිමින් සිටි මොහොතක, නැවත රට ගොඩනැගීම උදෙසා වූ අභියෝගය භාර ගැනීම ප්‍රතික්ෂේප කළ කිහිපදෙනා අතර ඔබද සිටිබව කණගාටුවෙන් වුවද පැවසිය යුතුය.

ඒ මොහොතේ අපගේ පෞද්ගලික දේශපාලන අනාගතය මායිම් නොකොට එය උගසට තබා රට වෙනුවෙන් මැදිහත් වූ බව හෘද සාක්ෂියක් ඇති මිනිසුන් සාක්ෂි දරනවා ඇත.

ඔබ විසින් ගිය විදෙස් ගමන්වලට අදාල මුදල් ලැබුණේ කාගෙන්ද,ඒ වියදම් වීම කොපමණද යන්න පිළිබඳව ඇතැම් විට ඔබට හෙළි කිරීමට නොහැකි වුවද මා විසින් අමාත්‍යාංශ භාරගත් අවස්ථාවේ සිට මේ දක්වා ගිය විදෙස් ගමන්, වියදම් සහ ඊට අදාල විස්තර සියල්ල නොවලහා හෙළි කළ හැකිය.

ඒ අනුව මා සහභාගි වූ විදෙස් සංචාර සඳහා අදාළ සියලු වියදම් පාහේ දරා ඇත්තේ මාගේ පෞද්ගලික මුදලින්ය. ඊට අදාල සියලු තොරතුරු අපගේ අමාත්‍යාංශ වලින් ලබාගත හැක. (ඇමුණුම බලන්න )

ඒ සංචාරවල අරමුණු වූයේ දේශපාලන පක්ෂයක් ප්‍රවර්ධනය කිරීම හෝ මැතිවරණ සඳහා අරමුදල් රැස්කිරීම නොවේ. අදාළ සංචාරවල ප්‍රතිඵල මාසයෙන් මාසයට දකින්නට ලැබුණු අතර වාර්තාගත සංචාරක පිරිසක් සහ සංචාරක ආදායමක් ලබා ගැනීමට හැකිවීම එහි ප්‍රමුඛතම කාරණාව බව අවධාරණය කරමි.

සංචාරක කර්මාන්තය තබා, සංචාරකයෙකුවත් හොයාගන්නට නොහැකි වකවානුවක් තුළ අප විසින් අමාත්‍යාංශය බාර ගැනීම සහ අද ලංකාවේ සංචාරක කර්මාන්තය ගොඩනැගී ඇති ආකාරය කොතෙක්ද යන්න කුහක වත ඉවත දමා බලන ඕනෑම කෙනෙකුට තේරුම් ගත හැකිය.

සුවිශාල සංචාරක පැමිණීමක් සහිතව සංචාරක කර්මාන්තයේ ඉතිහාසගත වාර්තාවක් තැබීමට මේ දෙවසර තුළ හැකි වූ අතර ලොව හොඳම සංචාරක ගමනාන්තය අතරටත්, ලොව වේගයෙන්ම දියුණු වන සංචාරක කර්මාන්තය ඇති රටක් ලෙසත් අපේ රට කීර්තියට පත්වූයේ මේ දෙවසර තුළය.


සංචාරක අංශය

78, ගාලු පාර, කොළඹ 03.

78, காலி வீதி கொழும்பு 03.

78, Galle Road, Colombo 03.

ඉඩම් අංශය

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, අංක 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

"மிஹிகத்த மெதுர", காணிச் செயலகம், இல. 1200/6, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.

"Mihikatha Medura", Land Secretariat, No. 1200/6, Rajamalwatta Avenue, Battaramulla.


CamScanner

අප විසින් ක්‍රීඩා අමාත්‍යාංශය භාරගනු ලැබුවේ මෙරටට එරෙහිව ක්‍රිකට් තහනමක් පනවා තිබියදී වන අතර එකී තහනම ඉවත් කර ගැනීම වෙනුවෙන් අවශ්‍ය කටයුතු සඳහා ද විදෙස් සංචාරවල යෙදීමට අපට සිදුවිය.

ලෝකයේ විවිධ රටවල සංචාරය කළ ඔබ දේශපාලන ප්‍රවර්ධනය කිරීම් හැරුණු කොට, රටේ අභිවෘද්ධිය වෙනුවෙන් අංශුමාත්‍රයක මැදිහත්වීමක් සිදුකොට ඇත්දැයි විමසීමට කැමැත්තෙමි.

රටක් මුහුණ දී ඇති අර්බුදකාරී මොහොතක පක්ෂ විපක්ෂ භේදයකින් තොරව රටේ ජනතාවගේ සුබ සිද්ධිය වෙනුවෙන් කැපවීම ශිෂ්ට සම්පන්න නායකයින්ගේ වගකීමය. එහෙත් රටේ ජන ජීවිත නගා සිටුවීම වෙනුවෙන් අංශුමාත්‍රයක මැදිහත්වීමක් නොකළ කුහක දේශපාලන අවස්ථාවාදීන් හැමවිටම සිදු කළේ මඩ සහ අවලාද මතින් සිය දේශපාලන න්‍යාය පත්‍රය දිගහැරීමය.


මා විසින් කළ විදෙස් සංචාරවලට අදාල වියදම් අප විසින් පෞද්ගලිකව දරා තිබියදී ඒවා රජය දැරූ වියදම් ලෙස ඔබ ප්‍රසිද්ධ වේදිකාවක සිදු කරන ලද බියගුළු සහ අවඥා සහගත ප්‍රකාශය අවලස්සනය. සහමුලින්ම බොරුය.

අසත්‍ය, සත්‍ය ලෙස ප්‍රකාශ කොට එකී අසත්‍ය තුළින් පටු වාසි අත්පත් කර ගැනීමේ ඓතිහාසික පුරුද්ද ජනතා විමුක්ති පෙරමුණ සතුවන නමුත් සත්‍ය හෙළිදරව් වීම කිසිදා වැළැක්විය නොහැකි බවද අවධාරණය කරමි.

ඔබ විසින් කරනු ලැබූ චෝදනාවට අදාල සියලු සත්‍ය තොරතුරු මේ සමග අමුණා ඇත.

ඒ අනුව ඔබ විසින් කරන ලද ප්‍රකාශය ඔබ විසින්ම නිවැරදි කළ යුතු බව අවධාරණය කරමි. නායකයකු වූ පලියට සර්වතෝ භද්‍ර නොවන අතර, ඔවුන් අතින්ද යම් යම් වැරදීම් සිදුවිය හැකි බව මා දැඩිව විශ්වාස කරමි. එය ඔබටද වලංගු ය.

ඒ අනුව ඔබ වෙතින් සිදුවූ වරද හෝ අතපසු වීම නිවැරැදි කරන මෙන් ඉල්ලා සිටිමි. එය ශිෂ්ඨසම්පන්න නායකත්වයක ලක්ෂණයකැයි ද මම විශ්වාස කරමි. ඔබ තෝරා ගන්නේ ශිෂ්ටත්වයේ මාවතද, අශිෂ්ටත්වයේ මාවත ද යන්න පිළිබඳව තීරණය ඔබ සතුය.



හරින් ප්‍රනාන්දු
සංචාරක, ඉඩම් හා ක්‍රීඩා, යෞවන කටයුතු අමාත්‍ය

CamScanner

ගරු සංචාරක හා ඉඩම් අමාත්‍ය ගරු හරීන් ප්‍රනාන්දු අමාත්‍ය තුමා සහභාගී වූ විදේශ වැඩසටහන

| කාල පරිච්ඡේදය | සංචාරය කරන ලද රට | සහභාගී වූ වැඩසටහන | සංචාරය සඳහා සංචාරක අමාත්‍යාංශයෙන් වැය වූ මුදල |
|---|---|---|---|
| 2022.06.16 - 2022.06.22 | මහා බ්‍රිතාන්‍ය හා ප්‍රංශය සහ ජර්මනිය | සංචාරක ප්‍රවර්ධන වැඩසටහනක් | අමාත්‍යාංශය මගින් ගෙවා නැත |
| 2022.09.01 -2022.09.02 | ඉන්දියාව | සංචාරක ප්‍රවර්ධන වැඩසටහනක් | අමාත්‍යාංශය මගින් ගෙවා නැත |
| 2022.09.25 සිට 2022.09. 30 ( දින06) | ඉන්දියාව | Road Show සඳහා සහභාගී වීම | නැත |
| 2022.10.05 සිට 2022.10.07 (දින03) | ඉන්දුනීසියාව | 3rd Conference on Creative Economy, 5-7 October 2022 in Bali, Indonesia | අරාධනාවකි |
| 2022.10.7 සිට 2022.10.13 ( දින 07) | ජපානය | Business Visit | ආරාධනාවකි |
| 2022.11.03 සිට 2022.11. 11 ( දින09) | එංගලන්තය | ලෝක සංචාරක වෙළඳ ප්‍රදර්ශනය සඳහා සහභාගී වීම | නැත |
| 2023.02.12 සිට 2023. 02.14 ( දින 03) | ඉතාලිය | BIT ප්‍රදර්ශනය සඳහා සහභාගී වීම | නැත |
| 2023.03.06 සිට 2023. 03. 10 ( දින05) | ජර්මනිය | ITB 2023 Travel and Tourism Fair සඳහා සහභාගී වීම | නැත |
| 2023.03.23 සිට 2023.03. 24 ( දින02) | ඉන්දියාව | සංචාරක සංවර්ධනය සහ ප්‍රවර්ධනය පිළිබඳ රුස්වීමක් සඳහා | නැත |
| 2023.04.24 සිට 2023. 04. 29 ( දින06) | ඉන්දියාව | මාර්ග සංදර්ශන වැඩසටහනක් සඳහා සහභාගී වීම (Road Show) | නැත |
| 2023.05.02 සිට 2023.05.05 ( දින04) | ඩුබායි | අරාබි සංචාරක වෙළඳ පොළ සඳහා සහභාගී වීම | නැත |
| 2023.05.18 සිට 2023.05. 23 ( දින 06) | චීනය | (GITF) සංචාරක වෙළඳ පොළ සඳහා සහභාගී වීම | අමාත්‍යාංශය මගින් ගෙවා නැත |
| 2023.07.10 සිට 2023.07. 18 ( දින 09) | ඕස්ට්‍රේලියාව | මාර්ග සංදර්ශන වැඩසටහනක් සඳහා සහභාගී වීම (Road Show) | අමාත්‍යාංශය මගින් ගෙවා නැත |
| 2023.11.04 – 2023.11.09 | එක්සත් අරාබි එමිර් රාජ්‍ය සහ එක්සත් රාජධානිය | රාජකාරි - For participating AirShow | |
| 2024.02.07 – 2024.02.10 | ඉන්දියා | For participate in the OTM - 2024 | නැත |
| 2024.03.04 – 2024.03.08 | ජර්මනිය - බර්ලින් | For participating ITB berlin Convention - 2024 | නැත |
| 2024.03.15 – 2024.03.27 | ඕස්ට්‍රේලියාව | For participating B2B networking Sessions | නැත |
| 2024.05.07 - 2024.05.08 | ඩුබායි | For participate at the ATM | නැත |

ටී.එම්.ජේ.ඩබ්. තෙන්නකෝන්
අතිරේක ලේකම් (පාලන)
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ
ලේකම් වෙනුවට

ටී.එම්.ජේ.ඩබ්. තෙන්නකෝන්
අතිරේක ලේකම් (පාලන)
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
696/4, මරදාන පාර
කොළඹ 10.

CS CamScanner